23 වන පිටෙන්




ගෙවුණු 48 වසර තුළ ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව පිටතින් මෙන්ම ඇතුළතින්ද අවස්ථාවාදී, කණ්ඩායම්වාදී අභියෝග එකක් දෙකක් නොව බොහෝ ගණනක් පැන නැගුණි. ඒවා මුළුමනින්ම පැරදවූ ජනතා විමුක්ති පෙරමුණ දැන් එක එල්ලේ අධිරාජ්‍යවාදයට හා ධනවාදයට එරෙහිව සටන් වැදීම සඳහා පොදු ජනතාවට නායකත්වය දෙන එකම එක සංවිධානාත්මක බලවේගය බවට පත්ව තිබීම දැවැන්ත ජනතා ජයග්‍රහණයකි.

ශ්‍රී ලාංකීය ජනතාවගේ පවතින ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කරගැනීමේදීත්, තවත් අයිතීන් දිනාගැනීමේදීත් සමාජ සාධාරණය ස්ථාපිත කිරීම සඳහාත් ජනතා විමුක්ති පෙරමුණ කළ කැපකිරීම්, පරිත්‍යාගයන් අනන්තය. අප්‍රමාණය. ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණය දිනාගැනීම සඳහා ලාංකීය නිර්ධනීන් ධනපති පාලනයට එරෙහිව 1971 දී පළමුවැනි ආයුධ සන්නද්ධ නැගිටීමට නායකත්වය දුන්නේ ජනතා විමුක්ති පෙරමුණ බව ලාංකීය ඉතිහාසයේ කැපී පෙනෙන සේ සටහන් වී තිබේ.

1980 වකවානුව තුළ ශ්‍රී ලංකාවට විදේශ ආක්‍රමණ එල්ලවෙද්දී, ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට භෞමික අඛණ්ඩතාවයට, ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට, ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්වලට ඉතිහාසයේ බරපතළම තර්ජන එල්ල වෙද්දී, විදේශ ආක්‍රමණිකයාටත්, ඒ ආක්‍රමණිකයාට කැමැත්තෙන් ඉඩකඩ සැලසූ ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති විරෝධී කෲර ලාංකීය ධනපති පාලකයන්ටත් බෙදුම්වාදී ත්‍රස්තවාදයටත් ඒ සියලු සතුරන්ට සහාය පළකළ සියලු ජාතික හා ජාත්‍යන්තර බලවේගවලටත් එරෙහිව එක එල්ලේ සටන් කළේ ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙනි.

ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය, භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම වෙනුවෙන්, ජාතික විමුක්තිය වෙනුවෙන් සමාජ සාධාරණය ස්ථාපිත කිරීම වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ පරිත්‍යාග කළ ජීවිත, ලේ, දහඩිය, ශ්‍රමය, ධනය අනන්තය. අප්‍රමාණය. ඒ පරිත්‍යාග නොවන්නට ශ්‍රී ලංකාව බෙදුනු, නින්දාවට ලක්වුණු අඳුරු දේශයක් වන්නට තිබුණු බවට සැකයක් නැත. ජනතා විමුක්ති පෙරමුණ පසුගිය 48 වසර පුරා කැපවූයේ, සටන් කළේ යුක්ති ගරුක, නොබෙදුනු දේශයක්, සාධාරණ සමාජයක්, නිවහල් මිනිසෙක් වෙනුවෙන්ය. ඒ වෙනුවෙන්ම පමණි.

පසුගිය වසර 48 පුරා සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය වෙනුවෙන්ම කැපවුණු ජනතා විමුක්ති පෙරමුණ ලාංකීය ජනතාව වෙනුවෙන් දිනාගත් ප්‍රතිසංස්කරණ පිළිබඳවද සඳහන් කිරීම මෙහිදී අදාළය. ශ්‍රී ලංකාව තුළ සිදුවූ ප්‍රතිසංස්කරණ ගැන සලකා බලන විට ඒවා අතරින් යම් යම් ප්‍රතිසංස්කරණ ප්‍රගතිශීලී වූයේද, ප්‍රජාතන්ත්‍රවාදී වූයේද එවිට ඒ සියල්ල ඉදිරියට තල්ලු කළේද ජනතා විමුක්ති පෙරමුණ බව එක එල්ලේ කිව හැකිය.

1972 ජනරජ ව්‍යවස්ථාව ගෙනඑන්නට ලාංකීය ධනපති පාලකයන්ට බලකෙරුණේ 1971 අප්‍රේල් නැගිටීමේදී ජනතා විමුක්ති පෙරමුණ සටන් කළේ ''රැජිනගේ ආණ්ඩුවට එරෙහිව'' බව ධනපති පාලකයන්ටම පිළිගැනීමට සිදුවූ බැවිනි. ස්වභාවික නීතියට පටහැනි වෙමින් ජනතා විමුක්ති පෙරමුණේ දේශප්‍රේමී, විමුක්තිකාමී, අධිරාජ්‍ය විරෝධී, සමාජවාදී සටන්කාමීන්ට අපරාධ යුක්ති විනිශ්චය කොමිසම නමැති ධනපති කැකිල්ලේ ''අධිකරණයක්'' මගින් ජීවිතාන්තය දක්වා දඬුවම් දුන්නද ජනතා විමුක්ති පෙරමුණ යුක්තිය ඉදිරියේ නිවැරැදි කරමින් ධනපති පාලකයන්ට 1972 ජනරජ ව්‍යවස්ථාව සම්මත කරන්නට සිදුවිය.

ඒ හැරුණු විට ඉඩම් ප්‍රතිසංස්කරණ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් එදා ඉඩම් ඇමැති හෙක්ටර් කොබ්බෑකඩුව පාර්ලිමේන්තුව ඉදිරියේ පැහැදිලි ලෙස ප්‍රකාශ කළේ එම ''ඉඩම් ප්‍රතිසංස්කරණ පනත පාර්ලිමේන්තුවට ගෙන එන්නට බල කෙරුණේ 1971 අප්‍රේල් නැගිටීම නිසා'' බවයි.

ඉන්පසු 2001 දී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින ප්‍රජාතන්ත්‍ර විරෝධීබව මදකින් හෝ අඩුකිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 17 වැනි සංශෝධනය එක් කිරීමේ ප්‍රජාතන්ත්‍රවාදී කාර්යභාරය ඉටුකළේද ජනතා විමුක්ති පෙරමුණයි.

ලාංකීය ධනපති පාලක පංතිය ''පරිවාස කර'' ජනතාවට සහන ලබාදීමට ජනතා විමුක්ති පෙරමුණට හැකිවීම ලංකාවට පමණක් නොව ලෝක ප්‍රගතිශීලී ව්‍යාපාරයටම පවා අසිරිමත් අත්දැකීමක් වන බවට සැක නැත. ප්‍රතිසංස්කරණ තාවකාලික බවත් එනිසාම ඒවා හරහා ධනපති ආණ්ඩු තුළ ලැගීමෙන් වැළකීම විප්ලවවාදී පක්ෂයේ අතිශය වැදගත් පාඩමක් බව පසුගිය වසර 48 ඉතිහාසය තුළ ජනතා විමුක්ති පෙරමුණ සනිටුහන් කර තිබේ.

පසුගිය වසර 48 තුළ ජනතා විමුක්ති පෙරමුණ සිය වැරදි, අඩුපාඩු දෙස ස්වයං විවේචනාත්මකව ආපසු හැරී බලා නිවැරැදි වීමට තරම් නිහතමානී වී ඇත. එසේම ජනතා විමුක්ති පෙරමුණ මෙතෙක් ඉටුකළ අති දැවැන්ත කාර්යභාරය නිසි ලෙස අගය කර සිය අභිමානය ඉහළ තලයකට ඔසවා තබන්නට සමත්ව ඇත. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය තුළ පවා ජනතා විමුක්ති පෙරමුණ සිය හඬත්, ක්‍රියාකාරීත්වයත් ඉස්මතු කරන්නට මේ වනවිට සමත්ව සිටී.

ජනතා විමුක්ති පෙරමුණ නම් වූ පක්ෂය ශ්‍රී ලංකා දේශපාලන භූමිය තුළ තීරණාත්මක මතවාදීමය හා සංවිධානමය බලයක් හිමිකරගෙන නොතිබියේ නම් මෙරට දේශපාලනය පසුගිය 48 වසර පුරා වර්ධනය විය හැකිව තිබුණේ කුමන කුමන දිශාවන්ට විය හැකිද? එය පීඩිත පංති ජනතාව සමගි නොකරන්නට ලංකාව අද වනවිට සිංහල ශ්‍රී ලංකාවකුත්, දෙමළ ඊළමකුත්, මුස්ලිම් කිලස්ථානයකුත් ලෙස බෙදී යන්නට ඉඩ තිබුණි. ශ්‍රී ලංකාවේ ජාතික ගැටලුව ඉදිරියේ වල්මත්ව තිබුණු සියලුම ධනපති, අවස්ථාවාදී හා ජාතිවාදී පක්ෂ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ ඔළු කුහර තුළට රිංගවමින් තිබුණ ජාතිවාදී කුණු කන්දල් ඒවා තුළින් ඉවත් කළේ ජනතා විමුක්ති පෙරමුණයි. කිසිදු ජාතිවාදයකට යට නොවී සියලු වර්ගයේ ජාතිවාදයනුත් ජාතිවාදී බෙදුම්වාදයත් පරාජය කිරීමේලා ජනතා විමුක්ති පෙරමුණ ඉටුකළ මෙහෙය වෙනත් කිසිදු පක්ෂයකට ඉටුකළ නොහැකි විය. තමන් බෙදුම්වාදී යුද්ධය අවසන් කළේ යයි පාරම්බාන ජනාධිපතිවරයා තමන්ට ලැබුණු ජනවරමට පිටුපා 2006 දී දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය සමග සාකච්ඡා කර රනිල් - ප්‍රභා ගිවිසුම පිළිගන්නා බව ඒකාබද්ධ නිවේදන මගින් ප්‍රකාශයට පත්කළේය. එසේ තමන්ගේ සැබෑ ස්ථාවරය පැහැදිලිව ප්‍රකාශයට පත්කර බෙදුම්වාදය සමග සහජීවන ප්‍රතිපත්තියකට අවතීර්ණ වූ ජනාධිපතිවරයා යළිත් ඔහුට ලැබුණ ජනවරම වෙත තල්ලු කළේ ජනතා විමුක්ති පෙරමුණයි. එසේ නොවන්නට රනිල් - ප්‍රභා ගිවිසුම රනිල් - ප්‍රභා - මහින්ද ගිවිසුම බවට පත්වී ඒ හරහා ජාතිවාදී දෙමළ ඊළම ස්ථාපිත වන්නට ඉඩ තිබුණි.

මේ ආකාරයෙන් පසුගිය වසර 48 පුරාම ජනතා විමුක්ති පෙරමුණ රටත් ජනතාවත් ඉදිරියටය පැමිණි අභියෝග හා ව්‍යසන වළකාලීමට සියලු කැපකිරීම් සිදුකිරීමට එඩිතර ලෙස පියවර ගත් බව ජනතාවට යළි යළිත් මතක් කිරීම වරදක් නොවේ.

නිවැරැදි මෙන්ම සදාචාරාත්මක, විනයගරුක, ආදර්ශමත් දේශපාලනයක් පිළිබඳව සලකා බලද්දී ශ්‍රී ලංකාව වෙනත් බොහෝ රටවල් මෙන් දේශපාලන කාන්තාරයක් බවට පත්වන්නට ඉඩ තිබුණි. ශ්‍රී ලාංකීය ජනතාවට නිවැරැදි මගපෙන්වන පක්ෂයක හිමිකරුවන් වන්නට ඉඩ නොතිබිණි.

දැන් ජනතා විමුක්ති පෙරමුණ ආපසු හැරවීමට හෝ නැවැත්වීමට කිසිදු හැකියාවක් නැති බව හොඳ හැටි තේරුම්ගෙන සිටින එහෙත් ඔවුන් වෙලාගෙන ඇති කුහකත්වය නිසා අදත් ජනතා විමුක්ති පෙරමුණ මිනීමැරුවා! ට්‍රාන්ස්ෆෝමර් ගිනිතිබ්බා! ගස් කැපුවා! යයි බෙරිහන් දෙන්නෝ සිටිති. ඔවුන් උත්සාහ ගන්නේ ජනතා විමුක්ති පෙරමුණ විනාශ කිරීම සඳහා එහි නායකයන්, සාමාජිකයන්, හිතවතුන් දසදහස් ගණනින් ඝාතනය කිරීම සඳහා ඔවුන් විසින්ම ඇතිකළ සිවිල් යුද තත්වය වසංකර ජනතාව නොමග යැවීමටය. මෑතකදී මතුවුණ මාතලේ සමූහ

39 පිටට

D&M Lawyers

Suite 2, Level 1, 767 HIGH STREET
EPPING VIC 3076
Tel: (03) 9408 0837

Like our clients our lawyers come from diverse backgrounds and bring a wealth of different experiences and expertise

D&M Lawyers is a boutique law firm located in Epping, 22km north from the Melbourne CBD.

Legal Aid available, if applicable
Language spoken: English, Sinhalese, Italian and Macedonian
All other languages available through interpreters

Our areas of expertise include:
Property & Conveyancing
Immigration
Intervention Orders
Family Law
Wills & Power of Attorneys
VOCAT – Victims of Crime Compensation

FIRST CONSULTATION FREE

CONTACT US
(03) 9408 0837 or via email at admin@dandmlawyers.com.au

www.dandmlawyers.com.au